# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2079/35 - 2018 ජූලි මස 11 වැනි බදාදා - 2018.07.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/1978(x)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25 (අ) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල අතර, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරනු ලැබූ, ලියාපදිංචි අංක පීවී 72548 දරන, සමාගමක් වන සීගිස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසු, මෙහි පහත I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසි වලට යටත්ව, මෙහි පහත II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව සඳහන් වූ ද, එයට අනුරූපී II වන තීරයේ ඒ සඳහා වූ කෙටි යෙදුම දක්වා ඇති වූ ද උපාධිය පිරිනැමීමට මඟ සලසන්නා වූ උසස් අධ්‍යාපනය වර්ධනය කිරීමේ කාර්යය සඳහා එකී සීගිස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය උපාධි ප්‍රදානය කරනු ලබන ආයතනයක් ලෙස මේ නියමය මඟින් පිළිගනිමි.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

(මෙහි මින්මතු ''ආයතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) සීගිස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කරගැනීමේ දී 2012 සැප්තැම්බර් මස 28 වන දින අංක 995 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ චක්‍රලේඛය අනුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් කවර හෝ විෂය ධාරාවකින් 'S' (සාමාන්‍ය) සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කරගැනීමේ සුදුසුකම තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් තිබීම යන්නට අනුකූල විය යුතු ය.

**II වන උපලේඛනය**

| I වන තීරය<br>උපාධිය | II වන තීරය<br>උපාධිය සඳහා වූ කෙටි යෙදුම |
|---|---|
| තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය. | බීඅයිටී |

ආචාර්ය විජයදාස රාජපක්ෂ,
උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2018 ජූලි මස 06 වැනි දින,
කොළඹ දී ය.

07 - 830


1A - PG 4116 — 507 (2018/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*